සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා විද්‍යාලය.

සති පාසල 18

## තොරතුරු පත්‍රිකාව

රංගන කුසලතා වර්ධනය කර ගැනීමෙහිලා සිදුකෙරෙන ක්‍රියාකාරකම් අතර විවිධ සංගීත ඛණ්ඩවලට අනුකූලව ප්‍රකාශනාත්මක ව නිරූපණයන් ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ.කේවල මෙන්ම කණ්ඩායම් වශයෙන්ද මෙම නිරූපණයන් සිදු කළ හැකිය. මෙහිදී වාචික අභිනය භාවිත නොකෙරේ. වාදන ඛණ්ඩයේ අර්ථයට අනුකූලව අංග ප්‍රත්‍යාංග රිද්මයානුකූලව යොදා ගැනීම මෙන්ම සාත්වික අභිනය භාවිතයෙන් භාවයන් නිරූපණය කිරීම ද මෙහිදී සිදු වේ.

වාද්‍ය ඛණ්ඩයකට ප්‍රකාශනාත්මක නිරූපණයන් ඉදිරිපත් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් ඇත.

1. කාලය පිළිබඳ සැලකිලිමත් වීම.
2. අර්ථාන්විත බව.
3. ආරම්භය හා නිමාව මනාව සකස්කර ගැනීම.
4. සකස් කරගැනීම කාලය හා රිද්මය පිළිබඳ අවධානය යොමු කිරීම.
5. උචිත ලෙස අවකාශය භාවිතය.

මෙවැනි නිරූපණයන් තුළින් ලැබෙන ප්‍රයෝජන රැසක් හඳුනා ගත හැකිය.

1. විවිධ වාද්‍ය ඛණ්ඩ වින්දනය කිරීමට යොමු වීම.
2. අර්ථය ජනනය වන ලෙස රූපණය ඉදිරිපත් කිරීමේ හැකියාව ලැබීම.
3. වාද්‍ය ඛණ්ඩයට අර්ථ සැපයීමේ හැකියාව.
4. එකම වාද්‍ය ඛණ්ඩයට විවිධ අර්ථ සැපයීම.

5. නිර්මාණාත්මක කුසලතා වර්ධනය.
6. පරිකල්පන හැකියාව දියුණු වීම.
7. රූපණ කුසලතා වර්ධනය.

<u>අභ්‍යාසය</u>

තොරතුරු පත්‍රිකාව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. වාද්‍ය ඛණ්ඩයකට ප්‍රකාශනයක් සිදු කිරීමේ දී සැලකිය යුතු කරුණු ලියා දක්වන්න.
2. මෙවැනි නිරූපණයන් සිදු කිරීම තුළින් ඔබට ලැබෙන ප්‍රයෝජන නම් කරන්න.
3. ඔබ කැමති සංගීත ඛණ්ඩ දෙකක් තෝරා ගෙන ප්‍රකාශනාත්මක නිරූපණ දෙකක් නිර්මාණය කරන්න.